# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2083/11 - 2018 අගෝස්තු මස 09 වැනි බ්‍රහස්පතින්දා - 2018.08.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට රත්මලාන - මොරටුව අපජල ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘති අදියර II යටතේ අංක 06 පොම්පාගාරය ඉදිකිරීම සඳහා විකල්ප ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,<br>
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 අගෝස්තු මස 03 වැනි දින,<br>
අංක 35, "ලක්දිය මැදුර",<br>
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,<br>
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.

### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 552A - උයන දකුණ, ග්‍රාම නිලධාරී වසමේ උයන ගමේ පිහිටි ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 21 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | |
|---|---|
| *උතුරට* | : උයන හරස් පටුමඟ ; |
| *නැගෙනහිරට* | : F. H. M. F. සිල්වා මහතා හිමිකම් කියන අංක 82/18 දරන නිවාස ඉඩම ; |
| *දකුණට* | : හිමිකරුවෙකු නොදන්නා නිවාස ඉඩම ; |
| *බටහිරට* | : අංක 10 දරන නිවාස ඉඩම. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය :* සොයාගත නොහැක.

08 - 796

1A - G 28239 — 18 (2018/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.<br>
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*